
# මා දුටු සිහිනය



චිතුලි හෙසන්යා කරුණාරත්න

| | |
|---|---|
| කෘතියේ නම | මා දුටු සිහිනය |
| කතෘගේ නම | චිතුලි හෙසන්යා කරුණාරත්න |
| කතෘගේ වෙනත් කෘති | මගේ සුරතලා "ඩිංගා"<br>කඩුපුල් මල් පිපිලා |
| කෘතිය පළ කරන දිනය | 2025-02-08 |
| ප්‍රථම මුද්‍රණය | 2025 |
| ලිපිනය | 300/10, පහළ ඊරියගම, පේරාදෙණිය. |
| ISBN අංකය | 978-624-208-231-8 |
| මුද්‍රණය | චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර. |

# පිදුම

මාගේ ආදරණීය මහාමායා

මෑණියන්ට මගේ මේ පොත

ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තූතිය

මට මේ පොත ලස්සනට ලියන්න  කියල දීල උදව් කළ මගේ ආදරණීය දමයන්ති  රත්නායක ගුරු මෑණියන්ටත්, මගේ ඉස්කෝලේ සියලුම ගුරු මෑණිවරුන්ටත්, මගේ අම්මා, අප්පච්චි ඇතුළු පවුලේ සියලු දෙනාටත් මම ගොඩක් ස්තූති වන්ත වෙනවා.

චිතුලි හෙසන්යා කරුණාරත්න වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.


කතෘ - චිතුලි හෙසන්යා කරුණාරත්න

ලිපිනය - නො.10/300, පහල ඊරියගම, පේරාදෙණිය

දුරකථන අංකය - 077-6644688



ගොඩාක් වැස්ස
දවසක්. හරිම
සීතලයි.
මට නිදිමතක්
ආවා.



මම මගේ ඇඳට ගිහිල්ලා
හොඳට නිදාගත්තා.

එක පාරටම මම ලොකු ලස්සන මාළිගාවක් දැක්කා. පාට පාට ලස්සන මාළිගාවක්.





මම මාළිගාව
ඇතුළට හෙමිහිට
ඇවිදගෙන ගියා.

ලස්සන නිල්පාට ගවුමක් ඇඳපු
ලස්සන සුරංගනාවියක්
හම්බ වුණා. එයා මට
ආදරෙන් කතා කළා.



තවත් ලස්සන සුරංගනාවියක් එතනට ආවා. ඒගොල්ලෝ සුරංගනාවියක් වගේ ලස්සනට මාව ඇන්දුවා.



ගොඩාක් මල් පිපුණු ලස්සන
වත්තක අපි සෙල්ලම් කළා.



ගොඩාක් රස කෑම අපි කෑවා.
මම ගොඩාක් දවස්
සුරංගනාවියෝ එක්ක හිටියා.
දැන් මට අවුරුදු 10 යි.



මට අම්මව මතක් වුණා. මම ඒක සුරංගනාවියන්ට කිවුවා.




නිල් පාට ඇදුම ඇඳපු සුරංගනාවිය මට එයාව මතක් වෙන්න තෑග්ගක් දුන්නා.



මාව රත්තරන් පාට ලොකු දොරක් ළඟට එක්ක ගියා. මට ඇස්දෙක වහගෙන එක.... දෙක තුන කියලා දහය වෙනකන් ගණන් කරන්න කිවුවා.



මම ඇස්දෙක අරිනකොට
මම මගේ අම්මා ළඟ හිටියා.
ලස්සන හීනයක් මම දැකලා
මට ආපසු එහේ යන්න ආසයි.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්